# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,479 - 2026 මාර්තු මස 06 සිකුරාදා - 2026.03.06

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී. )

## II කොටස - අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත. )


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... | 62 |
| බුදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... | — |
| නොතාරිස් ලැයිස්තුව ... ... | — |
| විවිධ දැන්වීම් ... ... | — |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2026 මාර්තු මස 27 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2026 මාර්තු මස 13 දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපැලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය

"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය. "

2026 ජනවාරි මස 02 දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

**එස්. ඩී. පාඩිකෝරාල,**
රජයේ මුද්‍රණාලයාධිපති.

මෙම *ගැසට් පත්‍රය* www. documents. gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

61 - B 082769 — - (2026/03)
C 1 -

# පිස්කල් විකිණීම්

**කුලියාපිටිය දිසා අධිකරණ බල ප්‍රදේශයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමයි

ඩීඑෆ්සීසී බැංකුව,
අංක 73/5, ගාලු පාර,
කොළඹ 03.

*.................පැමිණිලිකරු.*

කොළඹ දිසා අධිකරණයේ
නඩු අංකය : DMB/0017/2012
කුලියාපිටිය දිසා අධිකරණයේ
ඇස්කිසි අංකය : 94/2025

*එදිරිව*

ගඟුල ආරච්චිගේ සංජීව බුද්ධික,
සඳලංකාව අංක 31/2 දරන ස්ථානයේ "හිරු ට්‍රේඩර්ස් යන නාමය, අභිධානය සහ විලාසය යටතේ තනි පුද්ගල ව්‍යාපාරයක් පවත්වාගෙන යනු ලැබේ.

*...................විත්තිකරු.*

මෙම නඩුවේ වර්ෂ 2015 මැයි මස 12 දින දරන තීන්දු ප්‍රකාශය ප්‍රකාශයට පත්කර අනුමත වී ඇති හෙයින් එකී තීන්දු ප්‍රකාශය ප්‍රකාරව,

රුපියල් දස ලක්ෂ හැට දහස් තුන්සිය විසිහතරයි ශත හැට පහ (රු. 1,060,324.65) ක මුලු මුදලක් ද, වර්ෂ 2011.12.01 දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමවන තෙක් රුපියල් පන්ලක්ෂ අසූහය දහස් හැට දෙකයි ශත දහඅටයි (රු. 586,062.18) ක මුදල මත පවත්නා අනුපාතිකය අනුව 26% වූ වාර්ෂික පොලී අනුපාතිකය මත වන වැඩිදුර පොළිය ද, බැංකු ගාස්තු සහ අනිකුත් ව්‍යවස්ථාපිත ගාස්තු වර්ෂ 2015 මැයි මස 12 දින දරන අධිකරණයේ නඩු තීන්දු ප්‍රකාශය අනුව, විත්තිකරුගෙන් අයකර ගනු ලැබිය යුතු වූ ඉහත සඳහන් අයවිය යුතු මුදල්, නෛතික පොළිය සහ අධිකරණයේ නිලධාරියකු විසින් තක්සේරු කරනු ලබන නඩු ගාස්තු පැමිණිලිකරුට අයකර දීම සඳහා මා විසින් තහනමට ගන්නා ලද පැමිණිල්ලේ උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ අප්‍රේල් මස 07 දින පෙ. ව. 11.00 ට,**

එම නිශ්චල දේපළ පිහිටි පහත උපලේඛනයේ සඳහන් ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුළියාපිටිය ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත කටුගම්පොළ හත්පත්තුවේ පිටිගල් කෝරළේ සඳලංකාවේ පිහිටි පුස්වැල්ගොඩැල්ල නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු එස්. බී. අබේකෝන් විසින් මැන සකස් කරන ලද අංක 9160 හා 2007.07.22 දින දරන පිඹුරේ දැක්වෙන බෙදා වෙන් කළ බිම් කොටසට මායිම්,

උතුරට : ප්‍රාදේශීය සභා පාර ද, නැගනෙහිරට : පිළිවෙලින් ඩබ්ලිව්. එස්. ඇනී තිසේරා මහත්මිය, ජෝශප් වන්තිලක සහ ඩබ්ලිව්. එස්. සෙබස්තියන් තිසේරා යන අය හිමිකම් කියන මෙම ඉඩමේ ලොට් අංක 1, 2 හා 3 ද, දකුණට : මින් පෙර ජී. ඒ. එල්. රංජිත් පෙරේරා හිමිකම් කියන ලද මෙම ඉඩමේ ලොට් අංක 06 ද, බස්නාහිරට : පී. ලැම්බට් ප්‍රනාන්දු හිමිකම් කියන ඉඩම ද යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් දහහතක් (රූ. 2, පර්. 17) ක බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ ද වේ.

ඉහත විස්තර කරන ලද ඉඩම මෙහි පහත විස්තර කර තිබෙන ඉඩම සඳහා මැතක දී සිදු කරන ලද නැවත මැනීමක් වේ.

ඉහත කී පුස්වැල්ගොඩැල්ල නැමැති ඉඩමේ බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් මැන සාදන ලද අංක 62 හා 1963.04.23 දින දරන පිඹුරේ ලොට් අංක 07 ලෙස ලකුණු කළ බෙදා වෙන් කළ බිම් කොටසට,

උතුරට : ලොට් අංක 1, 2 හා 3 ද, නැගෙනහිරට ; ලොට් 6 ද, දකුණට : පුරන්අප්පුට සහ තවත් අයට අයිති ඉඩම් ද, බස්නාහිරට : පාර ද, යන මායිම් ඇතුළත රූඩ් දෙකකුත් පර්චස් දහහතක් (රූ. 2, පර්. 17) බිම් ප්‍රමාණයෙන් යුත් ඉඩම සහ එහි පිහිටි සියලු දේ.

මෙම ඉඩම කුලියාපිටිය ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ S -115/66 දරන පත්‍ඉරුවේ ලියාපදිංචි කර ඇත.

රෙජිස්ට්‍රාර්/ නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය - කුළියාපිටිය.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 20 දින දී ය.

03-70

**තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය**

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

යසුනාග රෙසිඩන්සීස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
අංක 74, ඩී. එස්. සේනානායක වීදිය,
මහනුවර.

කොළඹ වාණිජ මහාධිකරණ
නඩු අංකය : HC/Civil/502/2009/MR
තෙල්දෙණිය දිසා අධිකරණ
ඇස්කීසි අංකය : 01/26

*................පැමිණිලිකරු.*

*එදිරිව*

පී. එම්. එෆ්. ෆයිනෑන්ස් පී.එල්.සී.,
(පෙර : පීපල්ස් මර්චන්ට් ෆයිනෑන්ස් පී.එල්.සී. නම් වූ)
අංක 21, නවම් මාවත, කොළඹ 02.

*සහ දැනට :*

අංක 361, 361/1, ආර්. ඒ ද මෙල් මාවත, කොළඹ 03

*..................විත්තිකරු.*

වර්ෂ 2011 ක් වූ ජුනි මස 21 දින දරන කොළඹ වාණිජ මහාධිකරණයේ නඩු තීන්දුව අනුව එකී විත්තිකරු විසින් පැමිණිලිකරුට විරුද්ධව රු. 17,000,000.00 ක මුදලක් 2011 ක් වූ සැප්තැම්බර් මස 21 දින වන විට ගෙවා අවසන් කළ යුතු බවත්, නැතහොත් උපලේඛනයේ (අ) සිට (ඌ) දක්වා ඇති විත්තිකරු වෙත උකස් තබන ලද එකී ඉඩම් කොටස් (දැනට ඉතිරිව තිබෙන 567 D පිඹුරෙහි කැබලි අංක 08) විකිණීමෙන් විත්තිකරු වෙත අයවිය යුතු මුදල ලබා ගනු ලබන බවට ද නියම කර ඇති බැවින්,

නඩු ගාස්තු ඇතුලු අයවිය යුතු සියලුම ගාස්තු පැමිණිලිකරු විසින් විත්තිකාර සමාගම වෙත ගෙවිය යුතු බවට ද, (සමථයෙන් පසු මෙතෙක් ගෙවා ඇති රු. 12,494,574.30) ක මුදල අඩුකර) නියම කර ඇති බැවින්, ඉහත සඳහන් පැමිණිලිකරුගේ නිවාස, ඉඩම්, බඩුමුට්ටු, විදුලි උපකරණ, වාහන, යන්ත්‍රෝපකරණ, රැකියාවක නියුතු නම් වැටුප ද, පැමිණිලිකරු සතු යම් ගොඩනැගිල්ලක් වෙතොත් මාසික කුළිය ද, වෙනත් භාණ්ඩ හා දේපළ ද, පැමිණිලිකරු සතු බැංකු ගිණුම් තිබේ නම් එකී ගිණුමේ තිබෙන මුදල, චංචල සහ නිශ්චල දේපළ අයවිය යුතු ණය සහ බැරකම් තහනම් කිරීමෙන් අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින්,

එකී තීන්දුව ඉටුකිරීමට පැමිණිලිකරු විසින් අපොහොසත් වී පැහැර හැර ඇති බැවින්, එකී මුදල් අයකර දීම සඳහා කොළඹ වාණිජ මහාධිකරණ නඩු අංක HC/Civil/502/2009/MR දරන නඩුව යටතේ පැමිණිලිකරුට එරෙහිව නිකුත් කර ඇති ඇස්කීසිය ප්‍රකාරව, තෙල්දෙණිය දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ වන මා විසින් වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 02 දින නිසි ලෙස තහනම් කරන ලද පැමිණිලිකරුට අයත් මෙහි පහත උපලේඛනයේ සඳහන් නිශ්චල දේපළ,

**වර්ෂ 2026 ක් වූ මාර්තු මස 25 දින ප. ව. 12.00 ට,**

එකී නිශ්චල දේපළ පිහිටා ඇති ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් ප්‍රසිද්ධ කොට ප්‍රකාශ කරනු ලැබේ.

වෙන්දේසියේ දී ඉහළම ලංසු තබන්නා ගැණුම්කරුවන අතර, වෙන්දේසිය අවසන් වූ වහාම ගැණුම්කරු විසින්,

1. මුළු ගැණුම් මිලෙන් 25% ක මුදලක් ද,
2. සිවිල් නඩු විධාන සංග්‍රහයේ 258 වගන්තිය යටතේ අයකිරීම් ද,

විකිණීම අවසන් වූ වහාම මුදලින් මා වෙත (වෙන්දේසිකරු) ගෙවිය යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ. ගැණුම් මිලෙන් ගෙවන ලද්දේ 25% ක මුදලක් පමණක් නම්, ගැණුම් මිලෙන් ඉතිරි මුදල වන 75% ක මුදල දින 30 ක් ඇතුළත කොළඹ, වාණිජ මහාධිකරණයේ ඉහත අංක දරන නඩුවට තැන්පත් කළ යුතුය.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පාතදුම්බර උඩගම්පහ, නත්තරම්පොත ගමේ පිහිටි "තල්වත්ත එස්ටේට්" නැමති ඉඩමේ කොටසක් සඳහා බලයලත් මිනින්දෝරු එල්. ඒ. ඩී. සී. විජේතුංග විසින් 1983.10.29 දින මැන සාදන ලද අංක 7501 දරන පිඹුරේ කැබලි අංක 02 දරන කොටස සඳහා බලයලත් මිනින්දෝරු පී. පී. එස්. කේ. ජයරත්න විසින් 2007.12.02 දින මැන සාදන ලද අංක 545 සහ 546 දරන පිඹුරු වලින් නිරූපිත ඉඩම් කොටස් ඒකාබද්ධ කර නැවත මැන එම මිනින්දෝරු විසින් ම 2008.12.21 දිනැති අංක 567 D දරන පිඹුර මගින් කොටස් කරන ලද පිඹුරේ කැබලි අංක 08 දරන ප්‍රමාණයෙන් පර්චස් නවයයි දශම බිංදුවයි නවය (9.09) ක් විශාල ඉඩම් කොටසට එකී පිඹුර ප්‍රකාරව මායිම්, උතුරට : මෙම පිඹුරේ කැබලි අංක 07 ද, නැගෙනහිරට : මෙම පිඹුරේ කැබලි අංක 10 සහ කැබලි අංක 05 දරන පාරවල් ද, දකුණට : මෙම පිඹුරේ කැබලි අංක 09 ද, බස්නාහිරට : ඩී. එම්. ඊ. එච්. අමරසේකර සහ තවත් අයට හිමි දේපළ ද යන මායිම් තුළ පිහිටි ඉඩම, ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේ ද වේ. මෙම ඉඩම කුණ්ඩසාලේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E 832/161, E 832/162 පත් ඉරුවල ලියාපදිංචි කර ඇත.

*දේපළට පිවිසීම.-*

මහනුවර සිට හේවාහැට මාර්ගයේ කි. මී. 5 ක් පමණ යන විට හමුවන තැන්නකුඹුර නගරයේ සිට මහියංගනය මාර්ගය ඔස්සේ යන විට හමුවන නත්තරම්පොත නගරයෙන් මාර්ගයේ දකුණු පසට හමුවන ගල්බංගලාව පාරට පිවිසී ඉදිරියට යන විට හමුවන ගල්බංගලාව සංචාරක හෝටලය පසුකර ඉදිරියට යන විට වම් පසට හමුවන අවසාන හිස් බිම් කොටස වේ.

ඒ. ඒ. එම්. ඩී. ඩී. අමරසිංහ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
තෙල්දෙණිය.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 27 දින,
තෙල්දෙණිය දිසා අධිකරණයේ දී ය.

03-88

---

**කුරුණෑගල දිසා අධිකරණයේ දී ය**

2025.01.23 දින දැන්වීමේ උපලේඛනය සංශෝධනය කිරීමේ දැන්වීමයි

කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී,
PQ 131/PBPQ
අංක 68, බෞද්ධාලෝක මාවත, කොළඹ 04.

නඩු අංක : HC/Civil/933/2018
ඇස්කිසි අංකය : 47/25

සහ ; දැන්

එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් පීඑල්සී,
(කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී වර්ෂ 2022.03.31 දින එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ වීමෙන් පසු එල්. ඕ. එල්. සී. ෆිනෑන්ස් පීඑල්සී වශයෙන් පවත්වාගෙන යනු ලබයි.)
අංක 100/1, ශ්‍රී ජයවර්ධනපුර මාවත, රාජගිරිය,
(සමාගමේ නව අංකය : පීබී 244 පීක්‍යු)
*................පැමිණිලිකරු.*

*එදිරිව*

01. අබ්දුල් හමීම් මොහොමඩ් සලීම්,
අම්හාරි එන්ටර්ප්‍රයිසස්,
අංක 172, මීගමු පාර, බමුණාවල, කුරුණෑගල.

02. මොහම්මදු ජලීල් මොහොමඩ් සිද්දීන්,
අම්හාරි එන්ටර්ප්‍රයිසස්,
අංක 172, මීගමු පාර, බමුණාවල, කුරුණෑගල.

03. මුහම්මදු කාසිම් නසීර්,
රත්මිටියාගොඩ බංගලාව, පතින්ගස් කොටුව, මහවිල.

04. මොහමඩ් සහබ්දීන් මොහොමඩ් නිසාම්,
අංක 409/3, මීගමු පාර, බමුණාවල.

..................*විත්තිකරුවන්.*

වර්ෂ 2024 ක් වූ පෙබරවාරි මස 28 දින මෙම නඩුවේ ඇතුළත් කරන ලද තීන්දු ප්‍රකාශය අනුව එකී 01, 02, 03 සහ 04 වන විත්තිකරුවන්ගෙන් පැමිණිලිකරුට අයකර ගන්නට කියා නියම කළ රු. 26,743,558.98 ක මුදලක් සහ ඒ මත 2018.01.31 දින සිට මෙහි දින තෙක් පොළිය ද සහ ඉන් අනතුරුව සම්පූර්ණයෙන් ගෙවා අවසන් වන තෙක් තීන්දු ප්‍රකාශයේ සමස්ථ මුදල මත පොළිය සහ නඩු ගාස්තු අයකර ගැනීම සඳහා එකී 01, 02 වන විත්තිකරුවන්ගේ නිශ්චල සහ චංචල දේපළ සහ ගෙවල්, ඉඩම්, බඩුමුට්ටු, අයවිය යුතු ණය හා බැරකම් තහනම් කිරීමෙන් හා අවශ්‍ය වුවහොත් විකිණීමෙන් ලබාගත යුතු ය. තව ද, 01 සහ 02 විත්තිකරුවන් විසින් මෙම නඩුවේ ඇතුළත් කර ඇති සමථය ප්‍රකාරව රු. 100,000/- ක මුදලක් පැමිණිලිකරුට ගෙවා ඇති අතර එය අඩු කර අයකර ගැනීම සඳහා එකී නඩුවෙන් මා වෙත නිකුත් කර ඇති ඇස්කිසි බලය පිට ඉහත නම් සඳහන් වන 01 සහ 02 විත්තිකරුවන් වන අබ්දුල් හමීම් මොහොමඩ් සලීම් සහ මොහම්මදු ජලීල් මොහොමඩ් සිද්දීන් යන අයට අයත්, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපලෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියලු දේ කුරුණෑගල දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල් වන මා විසින් වර්ෂ 2025 ක් වූ ඔක්තෝබර් මස 01 දින කර ඇති තහනමට යටත්ව,

**වර්ෂ 2026 ක් වූ මාර්තු මස 27 දින ප. ව 2.00 ට,**

01 සහ 02 විත්තිකරුවන්ට අයත් මෙම දේපළ පිහිටා ඇති වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාවේ, බමුණාවල ග්‍රාම නිලධාරී වසමේ පිහිටි පල්ලේපිටිය වත්ත නැමති ඉඩම මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ පිහිටීම*.-

මෙම ඉඩම කුරුණෑගල මීගමුව පාරේ, කුරුණෑගල නගරයේ සිට කි. මී. 3.9 ක් මීගමු පාරේ යන විට බමුණාවල හන්දියට මීටර් 400ක් පෙරාතුව මෙම ප්‍රධාන මාර්ගයේ වම් පස මෙම දේපළ පිහිටා ඇත. එසේම මෙම දේපළ පිහිටි ඉඩම තුළ තට්ටු තුනක ගොඩනැගිල්ලක් තිබෙන අතර කුරුණෑගල දෙස සිට පැමිණෙන විට ෆැමිලි මාට් යනුවෙන් නම් කරන ලද නාම පුවරුවක් දකින්නට ලැබේ.

*ගෙවීමේ ක්‍රමය*.-වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්

(i) ගැණුම් මිලෙන් සියයට විසි පහක් (25%) ද,
(ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තියට (අ) අයකිරීම් ද,
(iii) විකුණුම් සඳහා වන සියලු වියදම් මුදලින් ගෙවිය යුතු ය. ගැණුම් මිලෙන් ඉතිරි 75% ක මුදල විකුණුම් දින සිට දින 30 ක් ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැනැපත් කළ යුතු ය.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, තිරගන්දහය කෝරලේ, වැඩවිල්ලි හත්පත්තුවේ, කුරුණෑගල ප්‍රාදේශීය සභා සීමාව තුළ කුරුණෑගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් බමුණාවල ග්‍රාම නිලධාරී වසමේ බමුණාවල ගම පිහිටි පල්ලේපිටියවත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ආර්. එම්. රත්නපාල විසින් මැන සාදන අංක 2743 ඒ සහ 2013.10.12 දින දරන පිඹුරේ ප්‍රකාර ලොට් 01, 02, 03, 04 දරන ඒකාබද්ධ ඉඩම් කොටසට මායිම්, උතුරට : මීගමුව සිට කුරුණෑගලට දිවෙන ප්‍රධාන මාර්ගය ද, නැගෙනහිරට : ජේ. ඩබ්. වැල්ලන්ඩන්බර්ග්ගේ ඉඩම ද, දකුණට : අංක 2743 ඒ දරන පිඹුරේ කැබලි අංක 05 ද, බස්නාහිරට : කාණුව ද යන මායිම් තුළ පිහිටි පර්චස් විසි පහයි දශම නමයක් (පර්. 25.9) ක් *හෙවත්* හෙක්ටයාර් 0.0655 ක් විශාල ඉඩම සහ ඒ තුළ ගොඩනැගිලි ඇතුළු සියලු දේ ද වේ. මෙම ඉඩම කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ G 248/93 යටතේ ලියාපදිංචි වී ඇත.

* ඉහත සඳහන් සංශෝධිත වූ උපලේඛනය

ඊ. එම්. පොඩිමැණිකේ,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
දිසා අධිකරණය,
කුරුණෑගල.

වර්ෂ 2026 ක් වූ පෙබරවාරි මස 23 දින දී ය.

03-89

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වනවා මෙන්ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින්ම ගෙවිය යුතුය.

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු ගාස්තු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සලකන්න.

**උපලේඛනය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| | **2026 වර්ෂය** | | | | | |
| **මාර්තු** | 2026.03.06 | සිකුරාදා | 2026.02.20 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.13 | සිකුරාදා | 2026.02.27 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.20 | සිකුරාදා | 2026.03.06 | සිකුරාදා | දහවල් | 03.00 |
| | 2026.03.27 | සිකුරාදා | 2026.03.13 | සිකුරාදා | දහවල් | 03.00 |
| **අප්‍රේල්** | 2026.04.02 | බ්‍රහස්පතින්දා | 2025.03.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.10 | සිකුරාදා | 2025.03.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.17 | සිකුරාදා | 2026.04.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.04.24 | සිකුරාදා | 2026.04.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මැයි** | 2026.05.08 | සිකුරාදා | 2026.04.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.05.15 | සිකුරාදා | 2026.04.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.05.22 | සිකුරාදා | 2026.05.08 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2026.05.29 | සිකුරාදා | 2026.05.15 | සිකුරාදා | දහවල් | 12.00 |

**එස්. ඩී. පාඩිකෝරාළ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ.බ.)*

2026 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.